# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2023 අංක 12 දරන විසර්ජන (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 අගෝස්තු මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 අගෝස්තු මස 25 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල :** රු. 6.00 **තැපැල් ගාස්තුව :** රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2023 අංක 12 දරන විසර්ජන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2023 අගෝස්තු මස 21 වන දින]

එල්.ඩී.-ඕ. 41/2023

## 2022 අංක 43 දරන විසර්ජන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2023 අංක 12 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** (මෙහි මින්මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 43 දරන විසර්ජන පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — 2022 අංක 43 දරන පනතේ දෙවන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ ''රුපියල් බිලියන හාරදහස් නවසිය හැත්තෑ නවයක්'' යන වචන වෙනුවට ''රුපියල් බිලියන දහතුන්දහස් නවසිය හැත්තෑ නවයක්'' යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ ''රුපියල් හාරදහස් දෙසිය විසිදෙක බිලියන දෙසිය තිස්තුන් මිලියන තුන්සිය හැට දෙදහසක්'' යන වචන වෙනුවට ''රුපියල් දහතුන්දහස් දෙසිය විසිදෙක බිලියන දෙසිය තිස්තුන් මිලියන තුන්සිය හැට දෙදහසක්'' යන වචන ආදේශ කිරීමෙන්.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ *වැය ශීර්ෂ* අංක 249 යටතේ දැක්වෙන භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ *මූලධන වියදම් තීරයේ* ''2,019,970,000,000'' යන ඉලක්කම් වෙනුවට ''11,019,970,000,000'' යන ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සංශෝධනය කිරීම

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.